
# ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් කුමකටද ?

## ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්

## කා වෙනුවෙන්ද ?

### 20 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ

### කියැවීමට අත්වැලක්




## පර්යේෂණ හා පුහුණු ඒකකය


**ලංකා බැංකු සේවක සංගමය**

අංක 20 පන්සල පාර, කොළඹ 10

දු.අ. 0112 693811    ෆැක්ස්: 0112 674840    ඊමේල්: cbeu@sltnet.lk    වෙබ්: www.cbeu.lk

# පොත කියැවීමට පෙර

1978 දී සම්මත කරගත් දෙවන ජනරජ ව්‍යවස්ථාව මේ වනවිට 19 වරක් සංශෝධනය වී ඇත. 20 වන සංශෝධනයද 2020 අගෝස්තු 05 වන දින නව ආණ්ඩුව බලයට පත්වී තෙමසක් ගතවීමටත් පෙර ඉදිරිපත් වී ඇත. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් 39 ක් ගොනු කර හමාරය. මෙම පෙත්සම් 39 න් 6 ක් වෘත්තීය සමිති සහ ඒවායේ ක්‍රියාධරයින් විසින් පවරනු ලැබ ඇත.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයද දේශපාලන බෙදීමක් ඔස්සේ කියවා ගැනීමට සමාජය පෙළඹීම නිසා එහි ඇති ජනතාවට අහිතකර බොහෝ වගන්ති සමාජය තුළ සාකච්ඡා නොවන තරම්ය. ජනමාධ්‍යද බොහෝවිට දේශපාලන බලු පොරයන් තීව්‍ර කිරීම උදෙසා නිල් සහ කොළ දේශපාලකයින්ගේ කට කැඩුණු වොයිස් කට් වෙත වැඩිබරක් තබා සැබෑ ප්‍රශ්ණ අමතක කරවති.

මෙවන් වටපිටාවක 20 වැනි සංශෝධනයේ ජනතාවට අහිතකර වගන්ති මොනවාද යන්න පිළිබඳ සැබෑ අවබෝධයක් ලබාගැනීම උදෙසා අවශ්‍ය වටපිටාව සැකසීමත්, වෘත්තීය සමිති ක්‍රියාධරයකු ලෙස හෝ සමාජ ක්‍රියාකාරිකයෙකු ලෙස ජනතාවට පීඩාවක් ගෙන දෙන කුමන හෝ කරුණක් ඔබ අනුමත නොකරනු ඇත යන අභිලාෂය සමාජ ක්‍රියාකාරීන්ගේ සාකච්ඡාවට බඳුන් කරලීමත් මෙම පොත් පිංච නිකුත් කිරීමේ අරමුණ වන්නේය.

ඒ සඳහා අවැසි ජනරජය යනු කුමක්ද? ජනරජයක පාලනය සඳහා ජනතාවගේ කැමැත්ත ප්‍රකාශය වන්නේ කෙසේද? ලංකාව රාජාණ්ඩු පාලනයේ සිට යටත් විජිතයක් දක්වා ගමන, පළමු සහ දෙවන ජනරජ ව්‍යවස්ථාවල විකාශනයන්, දෙවන ජනරජ ව්‍යවස්ථාව 19 වරක් සංශෝධනය වුණේ කෙසේද? 20 වන සංශෝධනයේ ඇති අහිතකර වගන්ති මොනවාද? ජනතාවාදී ව්‍යවස්ථාවක අන්තර්ගතය කෙලෙසද? යන කරුණු ඔබගේ දැන ගැනීම සඳහා මෙම පොත් පිංච හරහා සාකච්ඡාවට බඳුන්කර ඇත. වෘත්තීය සමිති ක්‍රියාකාරිකයෙකු ලෙසත් සමාජ ක්‍රියාකාරිකයෙකු ලෙසත් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ඔබගේ දැනුම වර්ධනය කරගැනීමට මෙම පොත පිටිවහලක් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

**සංස්කාරක මණ්ඩලය**

**ලංකා බැංකු සේවක සංගමය - පර්යේෂණ හා පුහුණු ඒකකය**

**අංක. 20, පන්සල පාර, මරදාන, කොළඹ 10**

**cbeu@sltnet.lk / www.cbeu.lk**

# පෙළගැස්ම

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය කෙබඳුද?
   - ✓ රාජාණ්ඩු පාලනය
   - ✓ ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස
   - ✓ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය
   - ✓ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික කොටස් තුන
   - ✓ ලංකාවේ රාජාණ්ඩු පාලනය
   - ✓ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සහ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
   - ✓ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව ලබාදුන් පොරොන්දු
   - ✓ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පසුබිම
   - ✓ 1977 මැතිවරණ ජයග්‍රහණය
   - ✓ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
   - ✓ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයන් සිදුවූ හැටි
   - ✓ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ගෙන ආ 20 වැනි සංශෝධනය
   - ✓ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණන ක්‍රියාවලියට සිදුවන අහිතකර බලපෑම
   - ✓ ලංකාවේ විගණන ඉතිහාසය
   - ✓ විගණන සඳහා මූලික නීතියේ ප්‍රතිපාදන
   - ✓ විගණන ක්‍රියාවලියක් සිදුවන්නේ කුමක්ද?
   - ✓ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දේශපාලන පසුබිම
   - ✓ ජනතාවාදී ව්‍යවස්ථාවක් පිළිබඳ අදහසක්
   - ✓ සමාප්ති සටහන

# ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය කෙබඳුද ?

**රාජාණ්ඩු පාලනය**

රාජාණ්ඩු පාලනයක නීති හැදීම, නීතිය ක්‍රියාත්මක කරලීම සහ යුක්තිය පසිඳලීම යන ක්‍රියා ත්‍රිත්වයම රජතුමා සතු විය. රජතුමාට ඉහත බලයන් (නීති සෑදීම, නීති ක්‍රියාත්මක කරලීම සහ යුක්තිය පසිඳලීම) ලැබුනේ පරම්පරාවෙන්, උත්පත්තියෙන් හෝ දෙවියන් විසින් දුන් ත්‍යාගයක් ලෙසිනි. ඉහත බලයන් තනි පුද්ගලයෙකු වටා එක් රැස් වනවිට පීඩාවට පත්වන විවිධ ජනකොටස් රජුට එරෙහිව කැරලි දියත් කළෝය. ක්‍රිස්තු වර්ෂ 1200 පමණ පටන් වර්තමානය දක්වාම මෙම කැරලි දියත් වේ.

1) රජුගේ ඉඩම්වල නොමිලේ වැඩකිරීම නිසා පීඩාවට පත්වන ගොවියන්,

2) අසාධාරණ බදු නිසා පීඩාවට පත්වන ප්‍රභූන් ඇතුලු ජන කොටස්,

3) කිසිදු මිනිස් අයිතියක් නැති වහලුන් විසින්

රජුගේ බලයට එරෙහිව කැරලි දියත්කරන ලදී,

1789 ප්‍රංශ විප්ලවය සහ ඇමරිකන් විප්ලවය රජුට එරෙහිව දියත් කළ කැරලි අතර ප්‍රධාන වේ.

**ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස**

මිනිසුන්ගේ භෞතික දියුණුවට රජුගේ පාලනය බාධාවක් නිසා රජුට එරෙහි කැරලි වර්ධනය විය. එම කැරලිවල ප්‍රතිපලයක් ලෙස දෙවියන්ගෙන් හෝ උත්පත්ති පරම්පරාවෙන් ලැබෙන බලය වෙනුවට ජනතාවගෙන් බලය ලබාගැනීමෙන් සිදුකෙරෙන යම් ක්‍රියාවලියක් එනම් "ප්‍රජාතන්ත්‍රවාදය" යන පාලන ක්‍රියාදාමය කෙමෙන් කෙමෙන් ස්ථාපනය කෙරිණ. ජනතාව විසින් ගොඩනගනු ලබන බලය ස්වාධිපත්‍ය බලය (Sovereign Power) ලෙස හැඳින්වේ. (මෙය පරමාධිපත්‍ය,පරම බලධාරීත්වය, රාජත්වය, ශ්‍රේෂ්ඨත්වය, ස්වෛරීභාවය යන නම් වලින්ද හඳුන්වයි)

**ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය.**

එංගලන්තයේ රජුට එරෙහිව සිදුවන කැරලිවල ප්‍රතිපලයක් ලෙස නීති හැදීමේ බලය " පාර්ලිමේන්තුව" නැමැති රජුගෙන් ස්වාධීන ව්‍යුහයකට දිනාගැනීමට හැකියාව ලැබේ. දෙවනුව යුක්තිය පසිඳලීමේ බලය උපරිමාධිකරණය යටතේ පිහිටුවෙන අධිකරණ පද්ධතියකට පැවරේ. මේ අනුව රජුගේ බලය ජනතා පරමාධිපත්‍ය බලය ලෙස රාජාණ්ඩුවේ සිට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයකට පරිවර්තනය වේ.

## ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ මූලික කොටස් තුන

දීර්ඝ කාලයක් පුරා ගොඩනැගෙන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව මූලික කොටස් තුනකින් වර්ධනය වේ.

1) විධායකය - නීතිය ක්‍රියාවෙහි යෙදවීම. (සන්නද්ධ හමුදා බලය, පොලිස් බලය ආදිය සහිතව)

2) ව්‍යවස්ථාදායකය - නීති සෑදීමේ බලය (පාර්ලිමේන්තුව)

3) අධිකරණය - නීතිය අනුව යුක්තිය පසිඳලීම සහ නීති කඩවන්නේ නම් ඊට ප්‍රතිකර්ම යෙදීම (අධිකරණ පද්ධතිය)

ජනතා පරමාධිපත්‍යය - රාජ්‍යයේ පරම බලය අවසාන අර්ථයෙන් ජනතාව සතුයි යන අදහස මෙහි වේ. ජනතාව පාලනය කරන්නේ ජනතාව විසිනි යන අදහස යථාර්ථයක් වීමට නම් ඉහත ආයතන තුන එකිනෙකින් ස්වාධීනව වැඩ කලයුතු අතරම එකිනෙක වෙනස් වැඩකොටස් සිදු කල යුතු වේ.

මෙලෙස ඉහත ආයතන තුනෙහි වගකීම් වෙන් වෙන්ව ස්වාධීනව පැවතීමට කියනව " බලය බෙදීමේ " න්‍යාය කියල.

මේ ආයතන තුන එකිනෙකට සාපේක්ෂව ස්වාධීනයි. එහෙම කරන එකට කියනවා බලතල බෙදීමේ න්‍යාය කියලා. ඉස්සර රජ කාලයේ මේ සියලු බලතල එක අයෙක් - රජු - විසින් පාවිච්චි කළේ. එතකොට බලතල සංකේන්ද්‍රණය වෙලා ඒකාධිපතීන් හැදෙනවා. ඒක වලක්වගන්න තමයි කලින් කී පරිදි ආයතන අතර සාපේක්ෂ ස්වාධීනත්වයක් ඇති කරල තියෙන්නෙ. මේ ස්වාධීනත්වය 'සාපේක්ෂයි' කියන්නේ ආයතන අනෙක් අතට එකිනෙක සමග සම්බන්ධ නිසා. උදාහරණයක් ලෙස ජනාධිපති පිස්සු කෙලිනව නම් පාර්ලිමේන්තුවට පුලුවන් දෝෂාභියෝගයක් ගෙනල්ලා ජනාධිපති අයින් කරන්න. අධිකරණයට පුලුවන් විධායකය ගන්න තීරණවලින් මූලික අයිතිවාසිකම් කඩ වෙනවා නම් ඒවාට විරුද්ධ තීරණ දෙන්න. මේ විදිහට එක එක ආයතන ව්‍යවස්ථාවෙන් දුන්න සීමාව තුල අනෙක් ආයතන ක්‍රියාත්මක වෙනව ද නැද්ද කියන එක චෙක් කරනවා සහ බැලන්ස් කරනවා (Check & Balance ). මේකට කියනවා සංවරණ සහ තුලන ක්‍රමය කියලා.

ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුකරණය තුල මේ සියලු ආයතන අවසාන අර්ථයෙන් මහජනයාට වග කියන්න ඕනෙ. මහජනයා තෝරාගන්නා නියෝජිතයින් හරහා තමයි මේ දේවල් ක්‍රියාත්මක වෙන්නෙ.

## ලංකාවේ රාජාණ්ඩු පාලනය

අදින් වසර 2563 කට පෙර ලංකාද්වීපය තුළ විජය රජුගෙන් ආරම්භවුණු රජු මූලික වූ ආණ්ඩු ක්‍රමය හෙවත් ලංකා රාජාණ්ඩුක්‍රමය, රාජවංශ 04 කට අයත් රජවරුන් විසින් වසර 2378 ක කාලයක් අඛණ්ඩව පවත්වාගෙන ඒමෙන් පසු සිංහලේ අන්තිම රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බ්‍රිතාන්‍ය සිරකරුවෙකු බවට පත්වීමත් සමඟ අවසන් වීය.

ක්‍රි.ව. 1815 මාර්තු මස 02 වැනි දින උඩරට ප්‍රභූන් සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා අතර අත්සන් කෙරුණු උඩරට ගිවිසුම සමඟින් ශ්‍රී ලංකාද්වීපයේ පාලනය බ්‍රිතාන්‍ය කිරීටය යටතට හෙවත් බ්‍රිතාන්‍ය රාජාණ්ඩු ක්‍රමය යටතට පත්වුණි.

1815 ලාංකීය රාජාණ්ඩුව අවසන් වී අප බ්‍රිතාන්‍ය රාජ කිරීටයට යටත් වෙනවා. බ්‍රිතාන්‍ය කිරීටයේ දේශීය නියෝජිතයා වන්නේ ආණ්ඩුකාරවරයාය. ආණ්ඩුකාරවරයා ඔහු සතු බලය පහත පරිදි ලංකාව තුල විමධ්‍යගත කරනවා.

1) 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ

2) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ

3) 1948 ඩොමීනියන් තත්වය බිහිවෙනවා.

1972 දී බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් මිදී ජනරජයක් බවට පත්වෙනවා. ඒ අනුව,

1) 1972 පලමු ජනරජ ව්‍යවස්ථාව

2) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

වර්තමානය දක්වා ගමන්මගේදී

01) රෝම ලංදේසි නීතිය ලෙස අධිකරණ පද්දතියත්,

02) ව්‍යවස්ථාදායක සභාවේ සිට 1948 දී ඩොමීනියන් පාර්ලිමේන්තුවත්

03) 1972 දී විධායක බලැති පාර්ලිමේන්තුවත්, නාමමාත්‍රික ජනාධිපති ධුරයත්,

(04) 1978 දී පූර්ණ බලැති විධායක ජනාධිපති ක්‍රමයත්, ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවත් ඇතිවිය.

## 1972 පලමු ජනරජ ව්‍යවස්ථාව සහ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව..

### 1972 පලමු ජනරජ ව්‍යවස්ථාව

1970 මහා මැතිවරණයෙන් පසුව බලයට පත්වුණු සමගි පෙරමුණු රජයට පාර්ලිමේන්තුව තුළ 2/3 ක බලයක් හිමිව තිබුණා. එම නිසා සමගි පෙරමුණු රජයට 1972 වසරේදී පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීමට හැකියාව ලැබුණා. එම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා නමින් නව තනතුරක් ඇතිකර තිබුණා. ඒ අනුව ලංකාවේ පළමු ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කිරීමට අවස්ථාව හිමිවුණේ විලියම් ගොපල්ලවටයි. නමුත් 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවට අනුව ජනාධිපති තනතුර බලතල රහිත තනතුරක් වුණා. ඉන්පසු වඩාත් බලවත් තනතුර වුණේ අගමැති තනතුරයි.

### 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

### විධායක ජනාධිපති ක්‍රමය බිහිවීම.

1977 වසරේ පැවැති මහා මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට 5/6 ක බහුතර බලයක් ලැබුණා. එය එම කාල වකවානුව වනවිට තනි පක්ෂයක් මහා මැතිවරණයකදී ලබාගත් ඉහළම ආසන ප්‍රමාණයයි. එදා එක්සත් ජාතික පක්ෂයට ලැබුණු විශාල ජනවරමෙන් ප්‍රයෝජන ගත් ජේ.ආර්. ජයවර්ධන ඒ වනවිට ක්‍රියාත්මක වෙමින් තිබුණු 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව සංශෝධනය කළා. 1977 වසරේ ඔක්තෝබර් 04 වැනිදා ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත්වුණු එම සංශෝධනය බහුතර කැමැත්තෙන් සම්මත වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1978 වසරේ පෙබරවාරි 04 වැනිදා ලංකාවේ පළමු විධායක ජනාධිපති ලෙසින් පත්වුණේ ජේ.ආර්. ජයවර්ධන යි. ඔහුගේ පත්වීම නිසා පුරප්පාඩු වුණු අග්‍රාමාත්‍ය තනතුර රණසිංහ ප්‍රේමදාසට හිමිවුණා.



**ජේ.ආර්. ජයවර්ධන දිවුරුම් දුන් හැටි**

## 1978 ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයාට ලැබුණු බලතල

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව බිහිවුණු විධායක ජනාධිපති නම් තනතුර ඉතාම බලවත් එකක් වුණා. ''**තමාට බැරි ගැහැණියක් පිරිමියෙකු කිරීමට පමණයි**'' යනුවෙන් එකල ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා පවසා සිටියේ විධායක ජනාධිපතිවරයාට අසීමිත බලයක් ලැබී තිබුණු නිසායි.

විධායක ජනාධිපති තනතුර බිහිවීමත් සමගම අගමැති තනතුර බල රහිත එකක් වුණා. එකල රණසිංහ ප්‍රේමදාස අගමැතිවරයා නිතරම පවසා සිටියේ ඔහුට ලැබුණේ පියන් කෙනෙක් වැනි අගමැති තනතුරක් බවයි. ඔහු ඉන් අදහස් කළේ අගමැතිවරයාට තිබුණු බලතල විශාල ලෙස අඩුවුණු බවයි. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට ලැබුණු ප්‍රධාන බලතල කිහිපයක් පහත දක්වා තිබෙනවා.

1. ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය ප්‍රධානියා ජනාධිපතිවරයායි. එසේම ජනාධිපතිවරයා විධායකයේ ප්‍රධානියා, රජයේ ප්‍රධානියා සහ හමුදා සේනාවන්ට අණ දෙන ප්‍රධානියා ද වෙනවා.

2. ජනාධිපති තෝරාගනු ලබන්නේ ජනතාව වන අතර, ඒ අවුරුදු හයක ධූර කාලයකටයි. ජනාධිපතිවරයාට ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුවට සහභාගීවීමට, ඇමතීමට සහ පණිවිඩ යැවීමට අයිතියක් ඇති අතර, සියලුම වරප්‍රසාද සඳහා හිමිකම්ද තිබෙනවා. එසේම ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියට අමතරව නිර්මුක්තිය සහ පාර්ලිමේන්තු සාමාජික ලෙස බලය, පාර්ලිමේන්තුවේ හෝ එහි සාමාජිකයෙක් ලෙස ඕනෑම වරප්‍රසාද කඩවීමක් සම්බන්ධව වගකිව යුතු නොවේ.

3. ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියායි. එම නිසා කැබිනට් රැස්වීමේ මුලසුන දැරීම සහ අගමැති තනතුරට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අතුරින් කෙනෙකු පත්කිරීම.

4. ජනාධිපතිවරයාගේ බලය යටතේ ව්‍යවස්ථාවට ඇතුළත්ව තිබෙන නීතින්ට එකඟව අදාළ කැඳවීම් සිදු කිරීමට, සභාව විසුරුවා හැරීමට, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සහ ජනමත විචාරණයක් කැඳවීම.

5. ඡන්දයෙන් පත්කළ ජනාධිපතිවරයා ව්‍යවස්ථා දායකය විසින් පැවරෙන බලය මත සියලුම පාර්ලිමේන්තු සැසිවාරයන් ආරම්භයට රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව පාර්ලිමේන්තුවට ප්‍රකාශ නිකුත් කිරීම.

6. පාර්ලිමේන්තුවේ චාරිත්‍රානුකූලව සභාවාරයේ මුලසුන දැරීම.

7. මහ කොමසාරිස්, පූර්ණ බලතල සහිත තානාපති සහ අනෙකුත් තානාපති නියෝජිතයන් භාරගැනීම සහ පිළිගැනීම, පත්කිරීම සහ තානාපති බලතල පැවරීම.

8. රාජ්‍ය ලාංඡනය ළඟ තබාගැනීම, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරුන් සහ කැබිනට් අමාත්‍යවරුන් පත්කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකරු සහ අනෙකුත් විනිශ්චයකරුවන් පත්කිරීම, ඉඩම් පවරාදීම් සහ මහජනයා වෙත පවරා දී ඇති නිශ්චල දේපළ ඇතුළු ඕනෑම දෙයක් මුද්‍රා තැබීම සඳහා රාජ්‍ය ලාංඡනය භාවිතා කිරීම ආදියට ජනාධිපතිවරයා ලෙස නීත්‍යානුකූල බලය හිමිවීම.

9. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ ලිඛිත නීතියට පටහැනි නොවන ලෙස, අන්තර්ජාතික නීතියට අනුව ජනාධිපතිවරයා කළයුතු හෝ කිරීමට අවසර ඇති එවන් සියලුම දෑ ක්‍රියාවට නැංවීම.

11. කමා කිරීම, දඬුවමක් කල් දැමීම, ලබාදුන් දඬුවමක් වෙනුවට ලිහිල් දඬුවමක් ලබාදීම සහ සම්පූර්ණ දඬුවම හෝ කොටසක් අවලංගු කිරීම.

12. යම් තැනැත්තෙකු ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙසින් කටයුතු කරන අවස්ථාවක ඔහු විසින් පෞද්ගලික තත්වයෙහිලා හෝ නිල තත්වයෙහිලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යා නොහැකි වීම.

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් ඔහුට ලැබී තිබුණු බලතල අසීමිතව භාවිතා කරනු ලැබුවා. එසේම ඔහුට පාර්ලිමේන්තුව තුළ 5/6 ක බහුතර බලයක් තිබුණු නිසා පහසුවෙන්ම බලය පාවිච්චි කිරීමට හැකි වුණා. 16 වතාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, 1982 ජනමත විචාරණය පවත්වා පාර්ලිමේන්තුව වසර 6 කින් දීර්ඝ කරගැනීම, 1982 වසරේදී පළමු ජනාධිපතිවරණය වසර දෙකකට පෙර කැඳවීම වැනි සිදුවීම් තුළින් ජේ.ආර්. ජයවර්ධන සිය බලය භාවිතා කළ ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකියි. නමුත් ජේ.ආර්. ජයවර්ධන සිය ධූර කාලයන් දෙක අවසන් වුණු පසු ව්‍යවස්ථාව වෙනස් කරමින් නැවත ජනාධිපතිවරණය සඳහා තරඟ කිරීමට උත්සාහ කළේ නැහැ. ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කිරීම නිසා ඔහුට එරෙහිව ගොඩනැඟී තිබුණු මහජන විරෝධය හේතුවෙන් එවැනි දෙයක් කිරීමෙන් වැළකී සිටියා විය හැකියි.



**1982 ජනාධිපතිවරණයේ අවස්ථාවක්**

## විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව ලබාදුන් පොරොන්දු

විධායක ජනාධිපති නම් තනතුර ඇති කළ කාලසමයේ සිටම ඒ පිළිබඳව නොයෙකුත් විරෝධතා එල්ල වුණා. එලෙස විරෝධය පළකල පාර්ශවයන් මතු කළ ප්‍රධාන කරුණ වුණේ තනි පුද්ගලයෙකුට අසීමිත බලයක් හිමිවීම ඉතාමත් භයානක බවයි. විනාශකාරී පුද්ගලයෙකුට එවැනි බලයක් හිමි වුනොත් භයානක තත්වයක් ඇති විය හැකියි. එම නිසා පසුගිය දශක 3 ක් තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව සමාජය තුළ කතාබහක් ඇති වුණා. එසේම එය ජනප්‍රියම ජනාධිපතිවරණ පොරොන්දුවක් බවටත් පත්ව තිබුණා. නමුත් කිසිම ජනාධිපතිවරයෙකු විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට උත්සාහ කළේ නැහැ.

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පසුබිම

1978 වසරේදී එවකට බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ රජය විසින් දෙවන ජනරජ ව්‍යවස්ථාව සම්මත කරගනු ලැබූවා. එලෙස ඉදිරිපත් කළ ව්‍යවස්ථාව වර්තමානය වනවිට 19 වතාවක් සංශෝධනය වී තිබෙන බව කවුරුත් හොඳින්ම දන්නා කරුණක්. 2020 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව බලයට පත්වුණු රජය දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සිදුකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගත්තා. ඒ අනුව, නුදුරු දිනකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය ඉදිරිපත් කරනු ඇති. මෙම ලිපිය 1978 ජනරජ ව්‍යවස්ථාවේ සංශෝධන 19 පිළිබඳවයි.



**පැරණි පාර්ලිමේන්තුව**

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයන් සිදුවූ හැටි

### පළමු ව්‍යවස්ථා සංශෝධනය - 1978 නොවැම්බර් 20

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව ක්‍රියාත්මක කර දින 74 කට පසුව එය මුල්ම වරට සංශෝධනය කෙරුණා. එහිදී යම් ගණයකට අයත් කාරණා සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළයුතු යැයි සම්මත කරමින් 16 වන පරිච්ඡේදයේ 140 වන ව්‍යවස්ථාව වෙනස් කරනු ලැබූවා.

### දෙවන ව්‍යවස්ථා සංශෝධනය - 1979 පෙබරවාරි 26

දෙවන ව්‍යවස්ථා සංශෝධනයේදී සිදුවුණේ 21 වන පරිච්චේදයේ 161 වන ව්‍යවස්ථාවේ (ඈ) ඡේදයේ (ii) වන අනුඡේදය පරිච්ඡින්න කොට අලුත් අනුඡේදය ආදේශ කිරීමයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඉල්ලා අස්වීම, පක්ෂයෙන් ඉවත් කිරීම හෝ වෙනත් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ පාර්ලිමේන්තු කාලසීමාව අවසාන වන අවස්ථාවක ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධව එහි ඇතුලත් වුණා.

### තෙවන ව්‍යවස්ථා සංශෝධනය - 1982 අගෝස්තු 27

තෙවන ව්‍යවස්ථා සංශෝධනයේදී සිදුවුණේ 7 වන පරිච්ඡේදයේ 31 වන ව්‍යවස්ථාවට (3අ) අනු ව්‍යවස්ථාව ඇතුළත් කිරීම සහ එම ව්‍යවස්ථාවෙහි (4) වන අනු ව්‍යවස්ථාව ඉවත් කිරීමයි. එමගින් ජනාධිපතිවරයා බලයට පත්වී වසර 4ක් ගතවුණු පසුව ඔහුට යළි ජනාධිපතිවරණයක් කැඳවීමේ අවස්ථාව හිමිවුණා. එසේම 7 වන පරිච්ඡේදයේ 38 වන ව්‍යවස්ථාවද එහි දී සංශෝධනය කෙරුණා. ජනාධිපතිවරයා ලෙස තෝරාගන්නා තැනැත්තා සිය ධූර කාලයෙහි සති 2ක් ඉකුත්වීමට පෙර එය භාරගැනීම සිතා මතාම පැහැර හැරියහොත් ජනාධිපති ධූරය හිස් නොවීමට විධිවිධාන සැලැස්වීම යන කරුණ එලෙස ව්‍යවස්ථාවට ඇතුලත් වුණා. තවද 21 වන පරිච්ඡේදයේ 160 වන ව්‍යවස්ථාව සංශෝධනය කළා. එහි ඇතුළත්ව තිබුණේ ජනාධිපතිවරයා සිය ධූරය දැරීම සම්බන්ධවයි.

### සිව්වන ව්‍යවස්ථා සංශෝධනය - 1982 දෙසැම්බර් 23

21 වන පරිච්ඡේදයේ 161 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් අපේක්ෂා කළේ පාර්ලිමේන්තුව පවත්නා කාලසීමාව 1989 වසරේ අගෝස්තු 4 වැනිදා දක්වා දීර්ඝ කරගැනීම යි. 1982 වසරේ දෙසැම්බර් 22 වැනිදා පැවැත්වූ ජනමත විචාරණය ජයග්‍රහණය කිරීමෙන් පසුව මෙම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට බලය ලැබුණා.



නව පාර්ලිමේන්තු අභ්‍යන්තරය

**පස්වන ව්‍යවස්ථා සංශෝධනය - 1983 පෙබරවාරි 25**

පස්වන සංශෝධනය මගින් 21 වන පරිච්ඡේදයේ 161 වන ව්‍යවස්ථාව සංශෝධනය කළා. පාර්ලිමේන්තුවේ පුරප්පාඩුවක් පිරවීම සඳහා මන්ත්‍රීවරයෙකු නම් කිරීම අදාළ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා පැහැර හැරියහොත් අතුරු මැතිවරණයක් පැවැත්වීම පිළිබඳව එහි ඇතුළත් වුණා.

**හයවන ව්‍යවස්ථා සංශෝධනය - 1983 අගෝස්තු 08**

මෙම සංශෝධනය මගින් 20 වන පරිච්ඡේදයේ 157 ව්‍යවස්ථාවට ඇතුළත් කළ 157 (අ) පිළිබඳව සඳහන් කිරීම සඳහා 13 වන පරිච්ඡේදයේ 101 වන ව්‍යවස්ථාව සංශෝධනය කළා. එසේම ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය උල්ලංඝණය කිරීමට එරෙහි තහනම සම්බන්ධයෙන් 157 (අ) වන ව්‍යවස්ථාව ඇතුලත් කළා. ඊට අමතරව ඉහත 157 (අ) ව්‍යවස්ථාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කළ හත්වන උපලේඛනය සඳහන් කරමින් 161 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සිදුකළා.

**හත්වන ව්‍යවස්ථා සංශෝධනය - 1983 ඔක්තෝබර් 04**

කිලිනොච්චි දිස්ත්‍රික්කය නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව 25 දක්වා වැඩි කිරීම සඳහා පළමු පරිච්ඡේදයේ 5 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සහ මැතිවරණ දිස්ත්‍රික්ක ප්‍රමාණය 25 දක්වා වැඩි කිරීමට 14 වන පරිච්ඡේදයේ 96 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම මෙමඟින් සිදුකෙරුණා. මහාධිකරණ කොමසාරිස්වරයන් පත්කිරීම සම්බන්ධයෙන් 15 වැනි පරිච්ඡේදයේ 111 (අ) වන ව්‍යවස්ථාව ඇතුළත් කිරීමද මෙම සංශෝධනයට ඇතුලත් වුණා.

**අටවන ව්‍යවස්ථා සංශෝධනය - 1984 මාර්තු 06**

මෙම සංශෝධනය මගින් ජ්‍යෙෂ්ඨ නීතිඥවරු, රාජ නීතිඥ වරප්‍රසාද සහිතව ජනාධිපති නීතිඥවරුන් ලෙස පත්කිරීම පිණිස ජනාධිපතිවරයාගේ බලතල පුළුල් කිරීම සඳහා 7 වන පරිච්ඡේදයේ 33 වන ව්‍යවස්ථාව සංශෝධනය කරනු ලැබුවා. සංශෝධිත 33 වන ව්‍යවස්ථාවට අනුව 16 වන පරිච්ඡේදයේ 136 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීමද එහිදී සිදුවුනා. එසේම රාජ නීතිඥ සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් සම්බන්ධයෙන් 169 (අ) වන ව්‍යවස්ථාව ඇතුළත් කිරීම ද සිදුකලා.

**නවවන ව්‍යවස්ථා සංශෝධනය - 1984 අගෝස්තු 24**

නවවන සංශෝධනය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත්කර ගැනීමට සුදුස්සන් නොවන රජයේ සේවකයන්ගේ වැටුප් සකස් කිරීමට 14 වන පරිඡේදයේ 91 වන ව්‍යවස්ථාව සංශෝධන කළා.

**දසවන ව්‍යවස්ථා සංශෝධනය - 1986 අගෝස්තු 06**

මෙම සංශෝධනය මගින් මහජන ආරක්ෂක ආඥා පනත යටතේ ප්‍රකාශනයක් සඳහා 2/3 බහුතරයෙහි අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා 18 වන පරිච්ඡේදයේ 155 වන ව්‍යවස්ථාව සංශෝධනය කළා.

**එකොළොස්වන ව්‍යවස්ථා සංශෝධනය - 1987 මැයි 06**

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ එකොළොස්වන සංශෝධනය මගින් සිදුකළේ පහත සඳහන් සංශෝධන කිහිපයයි.

1. මුල් අවස්ථා අපරාධ අධිකරණ බලතල මහාධිකරණයෙන් ඉවත් කිරීම සඳහා 15 වන පරිච්ඡේදයේ 111 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

2. උපලේඛනගත රජයේ නිලධාරීන් සම්බන්ධයෙන්ද නීති පැනවීම සඳහා අධිකරණ සේවා කොමිසමට විධිවිධාන සැලැස්වීම පිණිස 112 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. සියලු මුල් අවස්ථා අධිකරණවලට අනුයුක්ත නියෝජ්‍ය පිස්කල්වරයන් අධීක්ෂණය හා පාලනය ක්‍රියාත්මක කරන්නා වූ පිස්කල්වරයෙකුගේ තනතුර නිර්මාණය කිරීම සඳහා 113 (අ) වන ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

4. උපලේඛණගත රජයේ නිලධාරීන් මාරු කිරීමට පමණක් අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාගේ බලය සීමා කිරීම සහ පිස්කල්වරුන්

ද උපලේඛනගත රජයේ නිලධාරීන් අතරට ඇතුළත් කිරීම සඳහා 114 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

5. එක් එක් විනිශ්චය පීඨයක් සමන්විත වියයුතු විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව අඩු කිරීම සඳහා 16 වන පරිච්ඡේදයේ 146 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

6. පිස්කල්වරුන් වෙනුවට නියෝජ්‍ය පිස්කල්වරුන් යෙදවීම සඳහා පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**දොළොස්වන ව්‍යවස්ථා සංශෝධනය - 1987 සැප්තැම්බර් 25**

මෙම සංශෝධනය පිළිබඳ යෝජනාව 1987.09.25 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් ස්ථාවර නියෝග 47 (5) යටතේ අමාත්‍යාංශ වාර්තාව ඉදිරිපත් නොකළ බැවින් ඉදිරි කටයුතු සිදුකලේ නැහැ.

**දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය - 1987 නොවැම්බර් 14**

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභා පනත ඉදිරිපත් කළා. පහත දක්වා ඇත්තේ 13 වන සංශෝධනය මගින් සිදුකළ සියලුම සංශෝධනයන් පිළිබඳවයි.

1. දෙමළ බස රාජ්‍ය භාෂාවක් කිරීම සහ ඉංග්‍රීසි සන්ධාන භාෂාවක් කිරීම සඳහා 4 වන පරිච්ඡේදයේ 18 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

2. අභියාචන අධිකරණ බලය පිළිබඳව වුණු 16 වැනි පරිච්ඡේදයේ 138 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. සෑම පළාතක් සඳහාම පළාත් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 17 වන පරිච්ඡේදයේ ව්‍යවස්ථා 154 (අ) සිට 154 ද ඇතුළුව XVII 3 (අ) ඡේදය ඇතුළත් කිරීම.

4. මහජන ආරක්ෂක ආඥා පනත යටතේ හදිසි අවස්ථා නියෝග සෑදීම පිළිබඳව 18 වන පරිච්ඡේදයේ 155 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

5. පළාත් සභා මගින් සාදනු ලබන ප්‍රඥප්ති ද ලිඛිත නීති යන නිර්වචනය යටතට ඇතුළත් කිරීම සඳහා 23 වන පරිච්චේදයේ 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

6. පළාත් නවය නම් කිරීම සඳහා අටවන උපලේඛනය ද, පළාත් සභා ලැයිස්තුව, සංවෘත ලැයිස්තුව සහ සමගාමී ලැයිස්තුව විස්තර කිරීම සඳහා නවවන උපලේඛනය ද ඇතුළත් කිරීම.

**දහහතරවන ව්‍යවස්ථා සංශෝධනය - 1988 මැයි 24**

මෙම සංශෝධනය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 225 දක්වා වැඩි කිරීමට ජාතික ලැයිස්තු ක්‍රමය හඳුන්වා දුන්නා. පහත දක්වා ඇත්තේ 14 වන සංශෝධනය මගින් සිදු කළ සංශෝධන ලැයිස්තුවයි.

1. ඇතැම් නඩුවලදී ජනාධිපතිවරයාගේ මුක්තීන් ඇතැම් අවස්ථාවලදී ක්‍රියාත්මක නොකරනු පිණිස 7 වන පරිච්ඡේදයේ 35 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

2. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 225 දක්වා වැඩි කිරීම පිණිස 10 වැනි පරිච්ඡේදයේ 62 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.
3. ජනමත විචාරණයක් පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී පනත් කෙටුම්පතක් සහතික කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන ඇතිව සටහන් නොකළ යුතු බවට කොන්දේසි ඇතුළත් කිරීම සඳහා 11 වන පරිච්ඡේදයේ 80 වන ව්‍යවස්ථාව සංශෝධනය.


4. සීමා නීර්ණය කොමිෂන් සභාව පිහිටුවීම සහ මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදීම පිළිබඳව වුණු 96 (අ) ව්‍යවස්ථාව ඇතුලත් කිරීම.

5. 96 (අ) ව්‍යවස්ථාව බලාත්මක කිරීම සඳහා 98 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

6. සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 99 වන වගන්තිය ආදේශ කිරීම.

7. මහ මැතිවරණයකදී එක් එක් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව මත පදනම්ව ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 29 දෙනෙකු තෝරා ගැනීම පිළිබඳව වුණු 99 (අ) ව්‍යවස්ථාව ඇතුලත් කිරීම.

8. ජනමත විචාරණ පිළිබඳ පෙත්සම් ද ඇතුළුව මැතිවරණ පෙත්සම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය පුළුල් කිරීම සඳහා 130 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.



ප්‍රථම විධායක ජනපති ජූනියස් රිචඩ් ජයවර්ධන මහතා

**පහළොස්වන ව්‍යවස්ථා සංශෝධනය - 1988 දෙසැම්බර් 17**

මෙම සංශෝධනය මගින් යම් පක්ෂයකට දිස්ත්‍රික්කයක් තුළ ආසනයක් ලබාගැනීම සඳහා අවශ්‍ය අවම ඡන්ද ප්‍රතිශතය 12.5% සිට 5% දක්වා අඩු කරනු ලැබූවා. පහත දක්වා ඇත්තේ 15 වන සංශෝධනය මගින් සිදුකළ සියලුම සංශෝධනයන් පිළිබඳවයි.

1. මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදීම අවලංගු කිරීම සඳහා 96 (අ) ව්‍යවස්ථාව ඉවත් කිරීම.

2. එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයෙන් තෝරා පත්කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරු සංඛ්‍යාව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් සහතික කිරීම පිළිබඳව වූ 98 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. සමානුපාතික නියෝජන ක්‍රමයේ සීමාව 1/8 සිට 1/20 දක්වා අඩු කිරීමට සහ මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදීම අවලංගු කිරීමට 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

4. ජනවාර්ගිකව හෝ අන්‍යාකාරයෙන්, කිසියම් ප්‍රජාවකින් පාර්ලිමේන්තුවට තේරී පත්වන මන්ත්‍රී සංඛ්‍යාව, එම ප්‍රජාවේ ජාතික ජනගහන අනුපාතය හා අනුරූප වන බව සහතික කිරීමට 99 (අ) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**දහසයවන ව්‍යවස්ථා සංශෝධනය - 1988 දෙසැම්බර් 17**

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ දහසයවන සංශෝධනය එමඟින් පහත සඳහන් සංශෝධන කිහිපය සිදුකරනු ලැබූවා.

1. පළාත් සභා මන්ත්‍රීවරුන්ට ද තමන්ගේ කාර්ය ඉටු කිරීමේදී ජාතික භාෂා දෙකෙන් කවරක් වුවද භාවිතා කිරීමට හැකිවනු පිණිස 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. සිංහල සහ දෙමළ පරිපාලන භාෂා ව්‍යවස්ථාදායකයේ භාෂා බවට පත්කිරීමට 22 වන හා 23 වන ව්‍යවස්ථා ආදේශ කිරීම.

3. සිංහල සහ දෙමළ, අධිකරණවල භාෂා බවට පත්කිරීම සඳහා 24 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

4. යම් නීතියක විධිවිධාන සහ මේ පරිච්ඡේදයේ විධිවිධාන අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් මෙහි විධිවිධාන බලපැවැත්වීම සඳහා 25 (අ) ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**දහහත්වන ව්‍යවස්ථා සංශෝධනය - 2001 ඔක්තෝබර් 03**

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ දහහත්වන සංශෝධනය මගින් සිදුකළේ පහත සඳහන් සංශෝධන කිහිපයයි.

1. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම සඳහා 41 (අ) සිට 41 (ඌ) දක්වා ව්‍යවස්ථා ද ඇතුළුව VII-A පරිච්ඡේදය ඇතුළත් කිරීම.

2. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළව IX පරිච්ඡේදය ඇතුළත් කිරීම.

3. ජනාධිපතිතුමා විසින් සිදුකරන පත්වීම් පිළිබඳව වූ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. මැතිවරණ කොමිසමට අදාළ XIV-A පරිච්ඡේදය ඇතුළත් කිරීම.

5. අධිකරණ සේවා කොමිසමට අදාළ XV-A පරිච්ඡේදය ඇතුළත් කිරීම.

6. ජාතික පොලිස් කොමිසමට අදාළ XVIII-A පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**දහඅටවන ව්‍යවස්ථා සංශෝධනය - 2010 ඔක්තෝබර් 09**

මෙම සංශෝධනය මගින් මූලික වශයෙන් ජනාධිපතිවරයාගේ ධූර වාර ගණන පිළිබඳ සීමාව ඉවත් කිරීම සිදුවුණා. මෙම පනත හදිසි පනත් කෙටුම්පතක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත්

කෙරුණා. ඊට අමතරව ජනාධිපතිවරයාගේ වගකීම්, පොලිස් හා පාර්ලිමේන්තු කොමිෂන් සභා බලතලවලට අදාල වෙනස්කම් ගණනාවක් මෙහිදී සිදුවුණා.

**18 වැනි සංශෝධනය හරහා ජනාධිපති බලතල තවත් වැඩි වෙයි.**

2010 මහා මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය ආසන 144 ක් දිනාගත්තා. ඉන්පසුව රජය තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගේ සහාය ලබාගනිමින් 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව තුළ සම්මත කරගත්තා. එම සංශෝධනය මගින් ජනාධිපතිවරයාට එම ධූරය දැරීම සඳහා තිබුණු වාර 2 ක සීමාව ඉවත්කර තිබුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 2015 වසරේදී තෙවන වරටත් ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වුණේ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ලැබුණු අවස්ථාව නිසායි. ඊට අමතරව ජනාධිපතිවරයා සතු වගකීම් යටතේ පොලිස් හා පාර්ලිමේන්තු කොමිෂන් සභාවල බලතලවලට අදාල වෙනස්කම් ගණනාවක් මෙයින් සංශෝධනය කළා. එම නිසා 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව බොහෝ පාර්ශවයන් විසින් විරෝධය දක්වනු ලැබුවා.



**හිටපු ජනාධිපති හා වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ**

**19 වැනි සංශෝධනය හරහා ජනාධිපති බලතල අඩු වෙයි.**

2015 වසරේ දී බලයට පත්වුණු යහපාලන රජය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. එමගින් ජනාධිපතිවරයා සතුව තිබුණු බලතල තරමක්දුරට අඩු වුණා. පහත දැක්වෙන්නේ එම ව්‍යවස්ථා සංශෝධනය මගින් බලතල අඩු වුණු ආකාරය පිළිබඳවයි.

2015 ජනවාරි 08 දින පත්වුනු යහපාලන ආණ්ඩුවේ පාර්ශව තුළ සිටි කණ්ඩායම් විසින් දීර්ඝ කාලීනව රටේ සිවිල් සංවිධාන සහ වෘත්තීය සමිති සිදුකළ ඉල්ලීම් මාලාවක් සැළකිල්ලට ගනිමින් 19 වන සංශෝධනයේදී

විධායකයේ බලතල අඩුකර වඩා ප්‍රජාතන්ත්‍රවාදී තත්වයක් ගොඩනැගීම සඳහා පියවර ගැනුණි.

1. වසර 6 ක්ව පැවැති ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර 5 දක්වා අඩු කිරීම.

2. ජනාධිපති තනතුර දැරිය හැකි වාර ගණන යළි 2 ක දක්වා අඩු කිරීම.

3. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිවයුතු බව සහ මාස 3කට වරක් පාර්ලිමේන්තුවට පැමිණිය යුතුවීම.

4. මෙම සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමේ හැකියාව උදා වුණා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරි අවස්ථාවේ ඔහුට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේ එම අවස්ථාව ලැබුණු නිසායි.

5. ධූරයේ සිටින ජනාධිපතිවරයා නැවතත් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වන්නේ නම් වසර 4ක් ගතවුණු පසුව එම ජනාධිපතිවරණය කැඳවිය යුතුයි.

6. ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම.

7. අමාත්‍ය මණ්ඩලය පත්කිරීමේදී අග්‍රාමාත්‍යවරයාගෙන් විමසා එම පත්වීම් කළ යුතු වීම. ඉන් අග්‍රාමාත්‍යවරයා සතු බලය වැඩිවීමක් සිදුවුණා.

8. වසර 4 1/2 ක් යනතුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකි වීම. ඊට පෙර විසුරුවා හැරීම සඳහා පාර්ලිමේන්තුවේ 2/3 ක මන්ත්‍රීවරුන් පිරිසකගේ කැමැත්ත අවශ්‍යවීම. චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනිය, 2001 වසරේ බලයට පත්වුණු එක්සත් ජාතික පක්ෂ රජය වසර 2 1/2 කින් පමණ විසුරුවා හැරියා. ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව එකිනෙකට විරුද්ධ පක්ෂයකින් පත්වුණොත් එවැනි තත්වයක් ඇතිවීමට වැඩි ඉඩකඩක් තිබෙනවා.

9. ද්විත්ව පුරවැසියෙකුට ජනාධිපති තනතුරට තරඟ කිරීමට වරම් අහිමි වීම.



**හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන**

යහපාලන රජය විසින් වඩා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඉදිරිපත් කළ 19 වන ව්‍යවස්ථා සංශෝධනය ප්‍රායෝගිකව භුක්ති විඳීමට ජනතාවට නොහැකි වූයේ ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර තිබූ බල අරගලයත්, ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන ක්‍රියාවට නැංවීමේදී අනුගමනය කළ වැරදි ක්‍රියා කලාපයත් නිසාය. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ජනාධිපති සටනේදී 19 හැඳින්වූයේ රට අගාධයට ඇද දමූ සංශෝධනයක් ලෙසය. මෙහිදී 19 හි ඇති ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහ ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොකළේ දේශපාලන කරුණු නිසා යන සාධක දෙක වෙන් වෙන්ව කියවා ගැනීමට සමාජයම අපොහොසත් විය. ඒ මන්දයත් යහපාලන රජයේ ක්‍රියාකාරීත්වය ජනතාව සම්පූර්ණයෙන්ම පිළිකුල් සහගතව ප්‍රතික්ෂේපකර තිබූ බැවිනි. මෙම යහපාලන පිළිකුල්භාවය 19 සංශෝධනයේ ඇති වඩා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයන් අහිමි කිරීමට පාර කැපූ සාධකයක් විය.

**ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ගෙන ආ 20 වැනි සංශෝධනය.**

පසුගිය දිනක 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය ඉදිරිපත් කරනු ලැබුවා. යෝජිත සංශෝධනය මගින් විධායක ජනාධිපතිවරයාගේ බලතලවල වැඩිවීමක් සිදුව තිබෙනවා. එලෙස වැඩිවුණු බලතල සහ ජනාධිපති තනතුර සම්බන්ධ සිදුවුණු වෙනස්කම් පිළබඳව පහත දක්වා තිබනවා.

1. ජනාධිපතිවරයාගේ වගකීමක් වුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වන වගකීම ඉවත් කිරීම.

2. විදේශ රටක පුරවැසිභාවය හිමි ශ්‍රීලාංකික පුරවැසියකුට ජනාධිපති අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වීමේ අවස්ථාව ලබාදීම.

3. ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට ඇති අවස්ථාව අහිමි කිරීම. මෙම තත්වය 1978 - 2015 කාල සමයේද තිබුණා. සරත් මුත්තෙට්ටුවේගම නම් විපක්ෂයේ මන්ත්‍රීවරයා 1987 වසරේදී

ජනාධිපතිවරයා අධිකරණයට යටත් කිරීම සඳහා 12 වැනි සංශෝධනය ඉදිරිපත් කළත් එය ක්‍රියාත්මක වුණේ නැහැ.

4. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව පත්වී වසරකට පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකියි. 2004 වසරේ චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනිය භාවිතා කළේ මෙම බලයයි.

5. ජනාධිපති පාර්ලිමේන්තුවට වගකිව යුතු බවට වුණු ප්‍රතිපාදනය ඉවත්කර තිබෙනවා.

6. ස්වාධීන කොමිෂන් සභා කිහිපයක් අහෝසි කිරීම සහ තවත් ඒවායේ බලතල අඩු කිරීම.

7. ජනාධිපතිට අමාත්‍යවරුන් පත්කිරීමේ සම්පූර්ණ අයිතිය ලැබීම.

8. ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස 30 දක්වා අඩු කිරීම.

9. හදිසි අණපනත් ලෙස පැය 48 ක් ඇතුලත පාර්ලිමේන්තුවට පනත් ඉදිරිපත් කිරීමේ බලය හිමිවීම. දැනට පාර්ලිමේන්තුවට පනතක් ගෙන ඒමේදී ඒ මගින් ජනතාවට ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ හැක. නව ක්‍රමය මගින් එය බරපතල ලෙස කප්පාදු කෙරේ.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවැති 153 සහ 154 වගන්ති වලින් කියැවෙන විගණකාධිපතිවරයා පත්කිරීම සහ එහි කාර්යභාරය 20 මගින් ඉවත් කිරීම හරහා රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය බරපතල ව්‍යසනකාරී තත්වයකට පත්වීමේ මංපෙත් විවර කර ඇත.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවමත් සම්මත වී නැහැ. නමුත් වර්තමාන පාර්ලිමේන්තුවේ සංයුතිය අනූව එය සම්මතවීමට ඇති ඉඩ වැඩියි. ඒ අනූව යළිත් පූර්ණ බලතල තිබෙන ජනාධිපතිවරයෙකු බිහිවනු ඇති. එවිට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යන වාක්‍යය අනාගත මැතිවරණ පොරොන්දු ගොඩට නැවතත් එකතු වනු ඇත.

**20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණන ක්‍රියාවලියට සිදුවන අහිතකර බලපෑම.**

**<u>ලංකාවේ විගණන ඉතිහාසය</u>**

ලංකාවේ විගණන ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේදී එය මිහිඳු රජ සමය තරම් ඈත අතීතයකට ගමන් කරයි. මිහින්තලා සෙල්ලිපිය තරම් ඈත යුගයක පවා රජුගේ ආදායම් වියදම් ගණන් තැබීම සහ පරීක්ෂාව, ඒ සඳහා පුද්ගලයින් නම් කිරීම හඳුනාගත හැකිය.

1796 වසරේදී මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍ය කිරීටයට යටත්වූ පසුව 1799 වසර වනවිට ''සෙසල් ස්මිත්'' නැමැති ඉංග්‍රීසි ජාතිකයෙකු විගණකාධිපති ලෙස සේවයකර ඇති බවට ඓතිහාසික තොරතුරු කරුණු සපයයි.

1806 වසරේදී බිහිවන විගණන දෙපාර්තමේන්තුවට 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් ''විගණකාධිපති'' යන තනතුර පිහිටුවනු ලබයි. ඩොනමෝර් ක්‍රමය යටතේ මෙරට විගණකාධිපති ලෙස ප්‍රථමයෙන් පත්වූයේ ඕ.ඊ. ගුණතිලක මහතාය. ඩොනමෝර් ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයා බ්‍රිතාන්‍ය කිරීටයට නොව මෙරට ව්‍යවස්ථාදායක සභාවට වගකිවයුත්තෙකු බවට පත්කරනු ලැබීය.

1947 දී ගෙන ආ සෝල්බරි ව්‍යවස්ථාව මගින්ද රාජ්‍ය මූල්‍ය විගණනය කිරීම සඳහා පුළුල් විෂය පථයන් ආවරණය වන පරිදි වගකීම් පවරා ඇත.

ඩොනමෝර් ව්‍යවස්ථාව සහ සෝල්බරි ව්‍යවස්ථාව තුළ රජයේ දෙපාර්තමේන්තුවල විගණන වගකීම් පවරා තිබුණත් පළාත් පාලන ආයතන සහ රජයේ සංස්ථාවල විගණන බලතල විගණකාධිපතිවරයාට නොතිබුණි.

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන සහ රජයේ දෙපාර්තමේන්තු සියල්ල රාජ්‍ය විගණනයට ලක්කරන ලදී.

<u>විගණනය ලංකාවේ මූලික නීතියේ සඳහන් වීම.</u>

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 148 අනු ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පාලනය ව්‍යවස්ථාදායකයට යටත්කර ඇත.

මෙලෙස පාර්ලිමේන්තුව යටතට පත්කරනු ලබන රාජ්‍ය මූල්‍ය පාලනය ප්‍රධාන ක්‍රම 2 කින් පාලනය වේ.

1. විසර්ජන කෙටුම්පත් සම්මත කිරීම. - අයවැය සම්මත කිරීමේ ක්‍රියාවලිය

2. අයවැය හරහා සම්මත වන ක්‍රියාවලිය සමාලෝචන ක්‍රියාවලිය - රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය

රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 අනුව විගණකාධිපති පත්කිරීම හරහාත්, 154 (1) වගන්තිය යටතේ විගණනය කරන සමාගම් තීර්ණය කිරීමත් 154 (2), (3), (4), (5) වගන්ති වලින් රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය පාර්ලිමේන්තුව වාර්තා කිරීම පිළිබඳවත් විස්තර දක්වා ඇත.

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව ගෙන ඒමෙන් පසු 1982 දී මුල්ම සමාගම් පනත ඇතිවන අතර, එම සමාගම් පනත යටතේ පිහිටුවන රාජ්‍ය සමාගම් විගණනය රාජ්‍ය විගණනය මගින් සිදුනොවේ.

මේ නිසාම මෙම රාජ්‍ය සමාගම්වලට තාවකාලිකව පත්වන අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරීත්වයන්හි විවිධ දූෂණ සහ අක්‍රමිකතා රාජ්‍ය විගණනයේ දෑසට වැලි ගසමින් සිදුවිය. තවද මෙම රාජ්‍ය සමාගම් හරහා විවිධ ආණ්ඩු ඔවුන්ගේ දේශපාලන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා මුදල් පොම්ප කිරීමද දක්නට විය.

රාජ්‍ය මූල්‍ය යන්නට රාජ්‍ය සමාගම් ඇතුලත් නොවීම නිසා 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ 148 අනු ව්‍යවස්ථාව මගින් දක්වා ඇති රාජ්‍ය මුදල් පාලනය ව්‍යවස්ථාදායකයට යටත් කළයුතුය යන්න දෝෂ සහිත වී ඇත.

මෙම දෝෂයන් හේතුවෙන් රාජ්‍ය සමාගම්වලට කෙටි කාලයකට පත්වන අධ්‍යක්ෂවරුන් සිදුකරන වගකීම් විරහිත ක්‍රියා කලාපයන් නිසා රාජ්‍ය සමාගම් සියල්ලම රාජ්‍ය විගණනයට ලක්කළ යුතු යැයි විශාල ජන මතයන් ගොඩනැගුණි.

රාජ්‍ය මූල්‍ය විගණනය සම්බන්ධ ජාත්‍යන්තර එකඟතාවයන් ද ඇත. ඒ සියලු රටවල සහභාගීත්වයෙන් පිහිටුවා ගත් International Organization of Supreme Audit Institutions - INTOSAI යි. INTOSAI ආයතනයේ ලීමා (Peru - Limo) ප්‍රකාශනය සහ මෙක්සිකෝ ප්‍රකාශනය අනුව රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය තහවුරු කිරීම. රාජ්‍ය විගණනයට අදාල නීති රටේ මූලික නීතියට ඇතුලත් කිරීම සහ එම නීතිය ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රතිපාදන සැපයීම යන කරුණුවලට අදාල එකඟතා ඇතිකරගෙන ඇත.

ඉහත කී ලීමා ප්‍රකාශනය සහ මෙක්සිකෝ ප්‍රකාශනය යන INTOSAI ප්‍රකාශනයන් දෙකම එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ (United Nations - UN) සම්මුති ලෙසද සම්මත කරගෙන ඇත.

රාජ්‍ය සමාගම් හී සිදුවන දූෂණ අක්‍රමිකතා පිළිබඳව මතුවන සමාජ විරෝධයත්, ජාත්‍යන්තර ආයතනයන් මගින් සිදුකෙරෙන දූෂණ පිටුදැකීමේ ක්‍රියාවලියත් හේතුවෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී 154 (1) වගන්තියට 51% ක් රාජ්‍ය කොටස් අයිතිය ඇති රාජ්‍ය සමාගම්ද රාජ්‍ය විගණනයට යටත් කරන ලදී.

19 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය බලගැන්වීමට අවශ්‍ය යෝජනාවන් ඇතුලත් වනුයේ හුදු දේශපාලන පක්ෂයක අවශ්‍යතාවයක් නිසා නොවේ. ඒ ජාත්‍යන්තර සම්මුතීන් අනුව රාජ්‍ය මූල්‍ය විගණනය විධිමත් කිරීමේ අර්ථයෙනි. එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය කරන රටක් ලෙස අප ව්‍යවස්ථාවෙන් රාජ්‍ය මූල්‍ය විගණණය බලගැන්වීමට ගත් උත්සාහය 20 වැනි සංශෝධනය හරහා ඉවත්කර ඇත. මෙය ජාත්‍යන්තර සම්මුතීන්වලට පටහැනි වීමක්ද වේ. මෙහි අනිටු විපාකයන්ද අපට ජනතාවක් ලෙස මුහුණදීමට සිදුවනු ඇත.

**<u>විගණන ක්‍රියාවලියක් සිදුවන්නේ කෙසේද?</u>**

විගණනය හරහා සංවරණ සහ තුලන (Check and Balance) ක්‍රියාවලිය බලගන්වයි. ඒ යම් ආයතනයක් පවතින නීති රීතින්ට අනුව කටයුතු කර ඇතිද යන්නයි. පවතින නීතිරීතිවලට අනුව කටයුත කිරීම විගණකාධිපති දෙපාර්තමේන්තුව හරහා සොයා බැලීමට යම් අයකු විරුද්ධ වන්නේ ඇයි? රාජ්‍ය මූල්‍ය පවතින කුමන හෝ සමාගමක් රජය විගණන ක්‍රියාවලිය බාධාවක් බවට පැමිණිලි කර තිබේද? එසේනම් ඒ කුමන සමාගමද? යන්න 20 වෙනි සංශෝධනය සම්මත කිරීමට පෙර රජය හෙළි කළ යුතුය. රාජ්‍ය විගණනය නිසා අගතියට පත් පාර්ශවයක් වේ නම් ඔවුන්ද රාජ්‍ය මූල්‍ය විගණන ක්‍රියාවලිය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමෙන් පෙර හෙලිකළ යුතුය.

**<u>20 වන ව්‍යවස්ථා සංශෝධනය නිසා රාජ්‍ය විගණනයෙන් ඉවත්වන රාජ්‍ය සමාගම් ලේඛනය</u>**

| | Company Name |
|---|---|
| 1 | Ceylon Fertiliser Company Ltd |
| 2 | Colombo Commercial Fertilizers Ltd |
| 3 | Airport & Aviation Services (Sri Lanka ) (Pvt) Ltd. |
| 4 | Mihin lanka (pvt) Ltd. |
| 5 | Sri Lankan Airlines Ltd |

| | |
|---|---|
| 6 | Sri Lanka Catering Ltd. |
| 7 | Lanka Hospitals Corporation Plc |
| 8 | Lanka Hospitals Dignosis (pvt) Ltd |
| 9 | NSB Fund Management Company LTD |
| 10 | Boc Travels (pvt) Ltd |
| 11 | Boc Property Development PLC |
| 12 | BOC Property Development Management (pvt) Ltd |
| 13 | Hotels Colombo 1963 Ltd |
| 14 | Ceybank Holiday homes (pvt) Ltd |
| 15 | BOC Management & Support Services (pvt) Ltd |
| 16 | Machent Bank of Sri Lanka & Finance PLC |
| 17 | People's Travels (pvt) Ltd |
| 18 | People's Leasing PLC |
| 19 | Management Services Rakshana (pvt) Ltd |
| 20 | Canwill Holdings (pvt) ltd |
| 21 | Sinolanka Hotel & Spa Pvt) Ltd |
| 22 | Helanco Hotels & Spa (pvt) Ltd |
| 23 | Canowin Hotels and Spa (pvt) Ltd |
| 24 | Sri Lanka Insuarance Coporation Ltd |
| 25 | Cricket Aid (Gurantee) Ltd |
| 26 | Lanka Building Materials Corporation Ltd |
| 27 | Central Engineering Services (pvt) Ltd |
| 28 | Information & Communication Technology Agency Of Sri Lanka (pvt) Ltd. |
| 29 | Lanka Government Information Infrasture (pvt) Ltd |
| 30 | Sri Lanka Computer Emergency Response Team (pvt) Limited |
| 31 | Northsea Limited |
| 32 | Manthai Salt Limited |
| 33 | Lakdiva Engineering Company (pvt) Ltd |
| 34 | Lanka Leyland (pvt) Ltd |

35 Rakana Arakshaka Ltd

36 Lanka Logistic & Technologies Ltd

37 Distance Learning Center

38 Cey-Nor Foundation Ltd

39 Sri Lanka poultry Development company (pvt) Ltd

40 Milco (pvt) Ltd

41 Mahaweli Livestock Enterprices Ltd

42 Sri Lanka Thriposha Limited

43 Ocean View Development Company (pvt) Ltd.

44 Water's Edge Limited

45 Lanka Rest Houses (pvt) Ltd

46 Urban Investment & Development Company (Pvt) Ltd

47 Peliyagoda Warehouse Complex Company Ltd

48 Land Reclamation & Development Company Ltd.

49 LRDC Services (Pvt) Ltd

50 Natural Resours Management Services (pvt) Company Ltd

51 Mahaweli Live Stock & Agro Ltd

52 Mahaweli consultancy Bereau Ltd

53 Mahaweli Venture capital (Pvt) Ltd

54 GSMB Technical Services (pvt) Ltd

55 Lanka Gemological Laboratory (Pvt) Ltd

56 BCC Lanka

57 Paranthan Chemical

58 Lanka Phoshate

59 Lanka Mineral Sand

60 Lanka Salt Ltd

61 Sri Lanka Media Training Institute

62 Independent Television Network Limited

63 Hotel Developers Lanka PLC

64 Associated News Papers Of Ceylon Ltd

65 Lake House Property Development (pvt) Ltd

66 Obsever Jobs (pvt) Ltd

67 Lake house Connect (Pvt) Ltd

68 National Paper Company Ltd

69 Kurunegala Plantation Ltd

70 Elkaduwa Plantation Ltd.

71 Kalubowitiyana Tea Factory Ltd.

72 Galoya Plantations (pvt) Ltd

73 Chilaw Plantation Ltd

74 Sri Lanka Rubber Manufacturing & Export Corporation Ltd

75 Lanka Sugar Company Ltd

76 Hingurana Sugar Industries Ltd

77 Kantale Sugar Indrustries Ltd

78 Ceylon Petrolem storage Terminals Ltd

79 Litro Gas Lanka Ltd

80 Litro Gas Termanal Lanka (pvt) Ltd

81 Lanka Coal Company Ltd

82 Daduru Oya Mini Hydro (pvt) Ltd

83 Kumbalgamuwa Mini Hydro (pvt) Ltd

84 Trincomalee Power Company Ltd

85 Sri Lanka Energies HR (pvt) Ltd

86 Sri Lanka Energies (pvt) Ltd

87 Koladeniya Hydro Power Company (pvt) Ltd

88 Lanka Electricity Company

89 Ante LECo Metering Company (PVT) Ltd

90 LECO Projects (Pvt) Ltd

91 West Coast Power (Pvt) Ltd (Ordinary)

92 Jaya Container Terminal Ltd

93 Magampura Port Management (Pvt) Ltd

94 Sri Lanka Port Management & Consultancy Services (pvt) Ltd.

| | |
|---|---|
| 95 | Ceylon Shipping Coporation |
| 96 | Manganaguma Road construction Equipment Company (pvt) Ltd |
| 97 | Manganaguma Consultancy & Project Management Services (pvt) Ltd |
| 98 | Lanka Cement |
| 99 | Sri Lanka Institute of Nanotechnology (pvt) Ltd |
| 100 | Kahatagaha Graphhite Lanka Ltd |
| 101 | Lanka Salusala Ltd |
| 102 | CWE Economics Centers Services (pvt) Ltd |
| 103 | Lanka Sathosa Ltd |
| 104 | Sri Lanka State Trading (General ) Coporation |
| 105 | National Wealth coporation Ltd |
| 106 | National wealth Securaties pvt Ltd |
| 107 | CWE Construction Engineering (pvt) Ltd |
| 108 | Academy Of Financial Studies (Gurantee) Ltd. |
| 109 | CFC Founding (Guarantee) Ltd |
| 110 | Sri Lanka Youth Services (pvt) Ltd. |
| 111 | Skill Development Fund Ltd |
| 112 | Sri Lanka Foreign Employement Agency |
| 113 | National School of Business Management Ltd |
| 114 | Heli Tours (Pvt) Ltd |
| 115 | Manganaguma Emulsion production company (pvt) Ltd |
| 116 | Expresway Transport Company (pvt) ltd |
| 117 | Shipping & Aviation information & Reach (pvt) Ltd |

19 වන සංශෝධනයට පෙර ජනාධිපති කාර්යාලය සහ අගමැති කාර්යාලය විගණනය කිරීමේදී ජනාධිපති බලතල සහ අගමැති බලතල භාවිතා කරමින් තම කාර්යාල විගණනය නොකරන්නැයි ඇති කළ බලපෑම් 19 වන ව්‍යවස්ථා සංශෝධනයේදී යටපත් කරමින් ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති කාර්යාලය සහ සියලුම කොමිෂන් සභා විගණනයට යටත් විය යුතු බවට නිශ්චිතවම සඳහන් කරන ලදී.

එමෙන්ම 19 වන සංශෝධනයේදී විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීමට යෝජනා විය. මෙම කොමිෂන් සභාවට පුද්ගලයින් පත්කරනු ලබන්නේ පාර්ලිමේන්තු ව්‍යවස්ථා සභාවේ නිර්දේශය අනුව ජනාධිපතිවරයා විසිනි. මෙම 20 වැනි සංශෝධනයෙන් විගණන සේවා කොමිෂන් සභාව අහෝසිවීම නිසා රාජ්‍ය විගණනයේ මූල්‍ය ස්වාධීනත්වය සහ පරිපාලන ස්වාධීනත්වය මුළුමනින්ම බිඳවැටේ.

ඒ අනුව 20 වැනි සංශෝධනයේ දක්වා ඇති පරිදි,

- රාජ්‍ය සමාගම් රාජ්‍ය විගණනයෙන් බැහැර කිරීම.
- ඇතැම් ආයතන (ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාල, අමාත්‍යවරුන්ගේ කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස් කොමිෂන් සභාව) විගණනයෙන් ඉවත් කිරීම.
- විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම.

යන කරුණු හරහා මෙරට රාජ්‍ය මූල්‍ය පාලනය ව්‍යවස්ථාදායකයෙන් එනම් පාර්ලිමේන්තුවෙන් ඉවත් වනු ඇත. විගණන ක්‍රියාවලිය ඉවත් වූ කල එම ආයතනයන්හි දූෂණ අක්‍රමිකතා සිදුවන ආකාරය අමුතුවෙන් පැහැදිලි කළයුතු නැත.

**20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දේශපාලන පසුබිම**

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බලයට පැමිණියේ ජනතා අදහස් විමසීමෙන් ඉක්බිති නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගන්නා බවට වූ පොරොන්දුව මතය. කෙසේවුවද, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයට ලැබී තිබෙන විශාල මහජන වරම උපයෝගී කොට ගෙන එම රජය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සිට ඒකාධිපති රාජ්‍යයක් බවට පරිවර්තනය කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනඒමට උත්සාහ කරමින් සිටින බව පෙනෙන්නට තිබේ.

20 වන සංශෝධනය විසින් ජනාධිපතිට තමුන්ට කැමැති නීති සම්මත කරගැනීම සඳහා පාර්ලිමේන්තුව කැමති ආකාරයකට හැසිරවිය හැකි ආකාරයේ බලයක් ලබාදෙන ජේ.ආර්. ජයවර්ධන පන්නයේ බලයක් තහවුරු කිරීමට වෑයම් කරයි.

ආණ්ඩුවට පැය හතලිස් අටක් තුළ නීති සම්මත කරගැනීමේ බලය 20 වන සංශෝධනය මගින් ලබාදෙයි. මෙම බලය සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල ආදී වූ කම්කරු අයිතිවාසිකම් මෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වූ ගොවි අයිතිවාසිකම්, එම්සීසී ගිවිසුමට විරුද්ධ වීමට තිබෙන අයිතිය, ධීවර ජනයාට සිය ජීවිකාව සඳහා වූ අයිතිය ආදී ලෙස පොදු ජනයාට තිබෙන ප්‍රජාතාන්ත්‍රීය අයිතිවාසිකම් මැඩ පැවැත්වීම සඳහා භාවිතා කළ හැක.

එබඳු නීති අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කිරීමේ හැකියාව ජනතාවට අහිමි වනු ඇත.

20 වන සංශෝධනය යටතේ ජනාධිපතිට සහ අගමැතිට මහජන අරමුදල් ස්වකීය පෞද්ගලික යහපත සඳහා යොදා ගැනීමේ හැකියාව පවතී. ජනාධිපති සහ අගමැති කාර්යාලයන් විගණනයට යටත් නොවෙන නිසා, ඒ ගැන දැනගැනීමට ජනතාවට කිසිදු අවස්ථාවක් ලැබෙන්නේ නැත.

එසේම 20 වැනි සංශෝධනය යටතේ විදේශීය පුරවැසියන්ට (ද්විත්ව පුරවැසියන්ට) ජනාධිපති, අගමැති හා පාර්ලිමේන්තු මන්ත්‍රී ආදී වූ තනතුරුවලට පත්වීමේ හැකියාව ඇත. දේශයේ ආරක්ෂාව මෙන්ම භෞමික සුරක්ෂිතතාවයද අනතුරට ලක්කිරීමේ හැකියාව මේ ප්‍රතිපාදන තුළ පවතී.

20 වන සංශෝධනය යටතේ අධිකරණ විනිසුරුවන් පත්කරන්නේ ජනාධිපති විසිනි. එහි අදහස අධිකරණය තවදුරටත් ස්වාධීන එකක් නොවන බවයි. ජනතාවට ජනාධිපති ප්‍රශ්ණ කළ නොහැක. ඔහුට එරෙහිව නඩු පැවරිය නොහැක. විශාල වශයෙන් පිරිස් සිරගත කිරීම, ජනයා වධහිංසාවට ලක්කිරීම ආදී වූ අනීතික ක්‍රියාවල යෙදීමට ජනාධිපතිට පුළුවන්කම තිබුණද ඒවා අධිකරණය ඉදිරියේ ප්‍රශ්ණ කිරීමේ හැකියාව ජනතාවගෙන් උදුරාගෙන තිබේ.

එසේම, නව සංශෝධනය යටතේ ජනාධිපතිට මෙන්ම ඕනෑම දේශපාලන පක්ෂයකට කිසිදු දඬුවමකට යටත්වීමේ බිය නැතිව මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ හැකියාව ලැබී තිබේ.

තවද, 20 වන සංශෝධනය ප්‍රකාරව පාර්ලිමේන්තුව, අධිකරණය, මැතිවරණ කොමිසම, විගණන දෙපාර්තමේන්තුව, පොලීසිය ආදී වූ සියලු මහජන ආයතන ජනාධිපතිගේ රූකඩ බවට පත්වීමට නියමිතය.

මෙරට ජනතාව ජනාධිපති ඒකාධිපතියෙක් බවට පත්කිරීම සඳහා ඡන්දය දුන්නේ නැත. ජනතාව ජනාධිපතිවරයාට ඡන්දය දුන්නේ ''සමෘද්ධිමත්'' දේශයක් නිර්මාණය කිරීම සම්බන්ධ සිය වගකීම ඉෂ්ඨ කරනු උදෙසාය. ණය ගැති භාවය, කුසගින්න, කෘෂි හා ධීවර ක්ෂේත්‍රවල ප්‍රමාණවත් ආයෝජන නොමැතිවීම හා කම්කරු ජනයාට නිසි ආරක්ෂණයක් නොමැතිවීම ආදී වූ අනේකවිධ ප්‍රශ්ණවලින් මෙරට ජනයා දුක් විඳිති. ඒකාධිපති ජනාධිපතිවරයෙක් මෙරට මහජනතාවට අවශ්‍ය නැත. ඒ වෙනුවට, මෙරට මහජනතාව ඉල්ලා සිටින්නේ පාර්ලිමේන්තුව, අධිකරණයට හා ජනතාවට වගකියන ප්‍රජාතන්ත්‍රවාදී වූ ද දූෂණයෙන් තොර වූද ජනාධිපති ධූරයකි.

**වඩා හොඳ කුමක්ද ?**
**19 ද? 20 ද?**
**ජනතාවාදී ව්‍යවස්ථාවක් පිළිබඳ අදහසක්**

20 වෙනි සංශෝධනය ගැන කියවීමේදී 19 වෙනි සංශෝධනය වඩා හොඳ යැයි ඔබට සිතිය හැකිය. එනමුත් 19 වෙනි සංශෝධනය ක්‍රියාත්මකව පැවතියේදී පවා වැඩකරන ජනතාවගේ, ගොවියාගේ, ධීවරයාගේ අයිතිවාසිකම් කප්පාදුවන සිදුවීම් කොතෙකුත් දක්නට ලැබුණි. 19 න් ස්ථාපනය කළ කොමිෂන් සභාවලට පුද්ගලයින් පත්කිරීමේදී එම කොමිෂන් සභා පිහිටුවූ මූලික අරමුණින් විතැන් විය. එමෙන්ම 19 වෙනි සංශෝධනය ක්‍රියාත්මකව පැවතියදී කම්කරුවාට ආරක්ෂාව සැපයූ නීති කප්පාදු කරමින් ගෙන ආ ''ඊනියා ඒකීය කම්කරු නීතියද'' එක් උදාහරණයකි. 19 වැනි සංශෝධනය තුළ පවා ජනතාවගේ ජීවත්වීමේ අයිතිය හා කම්කරු නීති මූලික අයිතිවාසිකම් ලෙස පිළිගැනීමට ලක්නොවිනි. ජනතාවගේ ආර්ථික අයිතවාසිකම් මූලික අයිතීන් ලෙස පිළිනොගැණුනි. එසේනම් වැඩකරන ජනතාව ලෙස ජනතාවාදී ජනතාවගේ අභිලාශයන් මුදුන් පමුණුවන ව්‍යවස්ථාවක් ඇතිකරලීම සඳහා පෙළගැසිය යුතුමය. එය අද දවසේ විටින්විට පැමිණෙන ව්‍යවස්ථා සංශෝධනයන්ට එරෙහිවීම හෝ පක්ෂවීම යන ''පය බරවාට පිටිකර බෙහෙත් බැඳීමේ'' ප්‍රතිකර්මයක් වැනිය.

අප වැඩකරන ජනතාවක් ලෙස ව්‍යවස්ථා සංශෝධනයක ගුණ දොස් විග්‍රහය කිරීම සිදුකළ යුතුය. ඊට සමගාමීව ජනතාවාදී ව්‍යවස්ථාවක් වෙනුවෙන් සාමූහික අදහසක් ගොඩනගා ගැනීමටද මෙවන්ම එකමුතු සහගත උත්සාහයක් දැරිය යුතුමය.

**ජනතාවාදී ව්‍යවස්ථාවක පැවතිය යුතු මූලික ලක්ෂණ කිහිපයක්**

- ජනතාවගේ ජීවත්වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.
- ජනතාවගේ දේශපාලනික හා සිවිල් අයිතිවාසිකම් මූලික අයිතිවාසිකමක් ලෙස පිලිගැනීම.
- ජනතාවගේ සංස්කෘතික, සමාජ හා ආර්ථික අයිතිවාසිකම් මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.
- ජනතාවගේ පාරිසරික හා ස්වාභාවික සම්පත් අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.
- භූගෝලීය පිහිටීම්වලට අමතරව එක් එක් වෘත්තීය ක්ෂේත්‍ර නියෝජනය වන අයුරින් නියෝජිතයින් පාර්ලිමේන්තුවට යොමු කිරීමේ හැකියාව
- තමා පත්කර එවන නියෝජිතයා තමා අපේක්ෂා කළ කාර්ය ඉටු නොකරන්නේ නම් ඔහු ඉවත්කර යළිත් වෙනත් නියෝජිතයෙකු පත්කිරීමේ අයිතිය.

වැනි කරුණු ව්‍යවස්ථාවකට ඇතුලත් කිරීමට වැඩකරන ජනතාවගේ පාර්ශවයේ ඉදිරිපත් කළ හැකිය.

ඒ සියලු කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුතුය.

තවද වැඩිදුරටත් මෙම කරුණු සාකච්ඡා කිරීමේ අරමුණෙන් ඉහත කරුණු කිහිපය ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳ වැඩකරන ජනතාව තුළ පුළුල් සංවාදශීලී සාකච්ඡාවක් හරහා ව්‍යවස්ථාවක අඩංගු වියයුතු කරුණු පිළිඹිබු කිරීමේ යාන්ත්‍රණයක් ඇති කළ යුතුය.

ව්‍යවස්ථා සංශෝධනය ගුණ දොස් විවේචනයක යෙදෙන අතරතුරම ජනතාවාදී ව්‍යවස්ථාවක් ඇති කරලීම සඳහා වූ කතිකාවත අප පෙරට ගත යුතුමය. ජනතාවාදී ව්‍යවස්ථාවක දී ජනතා අභිලාෂයන් මුදුන් පැමිණවීම සඳහා වෘත්තිය සමිති හා බහුජන සංවිධාන එම කාර්ය ඔවුන්ගේ අතටම පත්කරගත යුතුය.

# සමාප්ති සටහන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ජනතාවට කෙතරම් වැදගත්ද යන්න පිළිබඳව ඔබට යම් අවබෝධයක් ඇතිවන්නට ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය විය යුත්තේ ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙනි. ජනතාවගේ පරමාධිපත්‍යය රැකෙන අයුරින්ය. විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය එකිනෙකින් ස්වාධීනව පැවතිය යුත්තේ එබැවින්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී තමා අදහන දේශපාලන දහම ඔස්සේ ඒවා දෙස නොබැලිය යුත්තේ බලයට එන ඕනෑම ආණ්ඩුවක් වසර 05 කට වරක් වෙනස්වීමට ඉඩ ඇති නිසාය.

අද ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු පැමිණීමේ අවසරය ලබාදීම හේතුවෙන් ඔබ අදහන දේශපාලකයෙකුගේ පැමිණීම ඔබගේ හිතට සනීපයක් ගෙන දුන්නද අනාගතයේ යම්දිනක රටට වගනොකියන ඕනෑම ජාත්‍යන්තර දෙබිඩ්ඩෙකුට ලංකාවේ ජනතා පරමාධිපත්‍යය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණීමට හෝ අගමැති, ජනාධිපති වීමට හෝ ඉඩකඩ ඇත. එවන් අවස්ථාවක විරුද්ධවීම අශ්වයා ගියපසු ඉස්තාලය වැසීමකි.

විගණන ක්‍රියාවලියද එසේමය. ඔබ අදහන දේශපාලන පක්ෂයක් ආණ්ඩු කිරීමේදී දූෂණ සිදුනොවනු ඇතැයි ඔබට තර්ක කළ හැකිය. එහෙත් වෙනත් ආණ්ඩුවක් බලයේ සිටින විටෙක දූෂණ වෙනුවෙන් හඬ නැගීම බීරි අලින්ට වීණා වැයීමක් වනු ඇත.

20 වැනි සංශෝධනය හරහා යෝජනා වී ඇති බොහෝ කරුණු සමාජයේ පීඩාවට පත් ගොවියන්, ධීවරයින් ඇතුළු වැඩ කරන ජනතාව තවත් පීඩාවට පත්කරවයි. ඒ ඔබගේ දේශපාලන මතය නියෝජනය කරන ආණ්ඩුවේ ධූර කාලය තුළ නොවන විටද විය හැකිය.

''බලය දූෂිතයි, වැඩි බලය වඩා දූෂිතයි'' යන්න ප්‍රසිද්ධ කියමනකි. වෘත්තීය සමිති නායකයෙකු, සමාජ ක්‍රියාකාරිකයෙකු ලෙස ඔබ සාමාන්‍ය ජනතාවට වඩා පියවරක් ඉදිරිය දැකිය යුතුය. අද ඔබගේ දැක්ම හෙට දවසේ සමාජ ප්‍රගමනය තීන්දු කරනු ඇත. 19 ටත් 20 ටත් ඉදිරියට ගිය''ජනතාවාදී ව්‍යවස්ථාවක් වෙනුවෙන්'' කටයුතු කිරීමට හෙට දවසේ නොව අද දවසේ සිටම කටයුතු ආරම්භ කළ යුතුය.

**20 වෙනි සංශෝධනයට එරෙහිව වෘත්තීය සමිති විසින් බෙදාහරින ලද ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකාව.**

# ජනවරම ඒකාධිපති වියරුවක් නොකරනු !

# වැඩකරන ජනයා දංගෙඩියට යවන ඒකාධිපති 20 පරදවමු !

2020 අගෝස්තු 05 දින ජනවරමකින් බලයට පත් වූ අභිනව ආණ්ඩුව තෙමසක් ගතවීමටත් පෙර ජනවරමට පයින් ගසා හමාරය. ඒ 20 වැනි සංශෝධනය හරහාය. 20 වැනි සංශෝධනය හරහා ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදයේ සිට ඒකාධිපතිත්වය කරා රැගෙන යාම නියතයකි.

විවිධ අඩුපාඩුකම් යටතේ වුවද මේ දක්වා පාරදෘශ්‍ය ස්වභාවයකින් පවත්වා ගත් ස්වාධීන කොමිෂන් සභා අහෝසි කර හෝ ඒවායේ ස්වාධීනත්වය නැති කර දමා ඇත. ඒ හරහා ජනතා කැමැත්ත විමසන මැතිවරණ ක්‍රියාවලියේ සිට රාජ්‍ය සේවය, අධිකරණ පද්ධතිය ආදී ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් දූෂිත වීමට නියමිතව ඇත.

හදිසියට මුවාවෙමින් කිසිදු මහජන අදහස් විමසීමකින් තොරව ජනාධිපතිවරයාට නීති කෙටුම්පත් පැය 24 ක් තුළ සම්මත කර ගත හැකිය. මේ හරහා ගොවියා ඉඩම් අහිමිව උපන් බිමෙහි ම අනාතයන් බවට පත් කරන MCC වැනි ඉඩම් පැහැර ගැනීමේ ගිවිසුම් එක් රැයකින් සම්මත කළ හැකිය.

එසේම, පසුගිය රජය සමයේ ගෙන ආ කම්කරු අයිතිවාසිකම් අළු දූහුවිලි කරන 'ඒනියා ඒකීය කම්කරු නීති සංශෝධනය' වැනි ජන පීඩක පනත් එක රැයකින් සම්මත විය හැකිය.

කම්කරුවා, ගොවියා, ධීවරයා උපන් බිමේම අනාථයින් වන්නේ එලෙසින්ය.

රාජ්‍ය විගණන ක්‍රියාවලියේ පැවති ස්වාධීනත්වය සම්පූර්ණයෙන් ම හකුලා දමා ඇත. මේ නිසා රාජ්‍ය සමාගම් 150 ක් පමණ රාජ්‍ය විගණනයෙන් ඉවත් කර හොරකමට  විවෘත කර ඇත. රාජ්‍ය ආයතනයන් හොරකමට විවෘත කර ඒවා විනාශ වන විට එම රාජ්‍ය ආයතනවලින් ජනතාවට ලැබෙන සේවය අහිමිවීමත්, රාජ්‍ය සමාගම්වල අහිමි වන ආදායම ජනතාවට බදු ලෙස පැටවීමත් යන දෙයාකාරයක වන්දියක් ජනතාවට ගෙවීමට සිදුවනු ඇත. ඒ අනුව විදුලිය, ඉන්ධන, ජලය ඇතුළු බොහෝ මහජන සේවාවන් සූරාකෑමකට ලක්වනු ඇත.

අගමැති, ජනාධිපති කාර්යාල විගණන ක්‍රියාවලියෙන් ඉවත් කර ඇත. ඒ කුමක් සඳහා ද? විගණනයට බිය විය යුත්තේ හොරකමට සිත් ඇත්තන් මිස වෙනකකු නොවන බව ඔබට වැටහිය යුතුය.

ජනපීඩක 20 වැනි සංශෝධනය යටතේ අධිකරණයේ සියලු විනිසුරන් පත් කිරීමේ බලය ජනාධිපති සතු වන්නේය. එවිට, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කුමන කතාවක් ද? එසේම ජනාධිපති සිදු කරන කිසිදු ක්‍රියාවක් නීතිය හමුවේ ප්‍රශ්න කිරීමට ඇති ඉඩ අහිමි වෙන්නේය. එමගින් ජනතා උද්ඝෝෂණ සියල්ල පොලිස් යකඩ පොල්ලෙන් මර්දනය කළ හැකිය. විරුද්ධවාදීන් ලෙස සලකා සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන පිරිස් සිරගත කරමින්, හිංසාවට ලක් කරමින්, බන්ධනාගාර ගත කරමින් මර්දනය කළ හැකිය.

20 වැනි සංශෝධනය හරහා ද්විත්ව පුරවැසියන්ට ජනාධිපති, අගමැති, පාර්ලිමේන්තු මන්ත්‍රී ලෙස තනතුරු දැරීමට ඉඩ සැලසීම තුළ රටට ජනතාවට වග නොකියන ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයෙකු මෙරට උත්තරීතර පාර්ලිමේන්තුවට පැමිණීමේ හැකියාව ලැබෙනු ඇත.

- සියලුම ස්වාධීන කොමිෂන් සභා හකුලමින්,
- රටට ජනතාවට වග නොකියන දෙබිඩ්ඩන් පාර්ලිමේන්තුවට පත් කරමින්,
- රාජ්‍ය ආයතන 150 ක් විගණනයෙන් ඉවත් කරමින්,
- ජනාධිපති, අගමැති කාර්යාල විගණනයෙන් ඉවත් කරමින්,
- හදිසි පනත් ලෙස ජන පීඩක පනත් සඳහා ඉඩ විවරකරමින්,
- විනිසුරන් එහෙයියන් කරමින්,
- අධිකරණයේ ස්වාධීනත්වය වනසමින්,

මෙරට, ප්‍රජාතන්ත්‍රවාදයේ සිට කුරිරු ඒකාධිපතිත්වයක් කරා රැගෙන යාමට ආණ්ඩුවට එකදු පුරවැසියෙකු හෝ බලයක් ලබා දී නොමැති බව ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය ලෙස අපි ආණ්ඩුවට අනතුරු අඟවන්නෙමු.

## ජනපීඩක ඒකාධිපති 20 පරදවමු !

**ජෝසප් ස්ටාලින්**
0773112541

**සිල්වෙස්ටර් ජයකොඩි**
0714986244

**ලීනස් ජයතිලක**
0712096867

**20 ට එරෙහි වෘත්තීය සමිති ව්‍යාපාරය**

4/65, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.
2020 ඔක්තෝම්බර් 02

**පර්යේෂණ හා පුහුණු ඒකකය - ලංකා බැංකු සේවක සංගමය**

**අංක. 20, පන්සල පාර, මරදාන, කොළඹ 10**

**දු.අ. 0112 693811** **ෆැක්ස්: 0112 674840** **ඊමේල්:** cbeu@sltnet.lk **වෙබ්:** www.cbeu.lk

ඔවුහු පළමුව කොමියුනිස්ට්වාදීන් සොයා පැමිණියහ.
මම නිහඬව සිටියෙමි.
ඒ මම කොමියුනිස්ට්වාදියෙකු නොවූ බැවිනි.

ඔවුහු දෙවනුව සමාජවාදීන් සොයා පැමිණියහ.
මම නිහඬව සිටියෙමි.
ඒ මම සමාජවාදියෙකු නොවූ බැවිනි.

ඉන්පසු ඔවුහු වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සොයා පැමිණියහ.
මම නිහඬව සිටියෙමි.
ඒ මම වෘත්තීය සමිති ක්‍රියාකාරිකයෙකු නොවූ බැවිනි.

එයිනුත් පසු ඔවුහු යුදෙව්වන් සොයා පැමිණියහ.
එහිදීත් මම නිහඬව සිටියෙමි.
ඒ මම යුදෙව්වෙකු නොවූ බැවිනි.

අවසන ඔවුහු මා සොයා පැමිණියහ.
එහෙත් ඒ වනවිට මා වෙනුවෙන් හඬ නැගීමට
කිසිවෙකු ඉතිරිව සිටියේ නැත.

හිට්ලර් බලයට ගෙන ඒම සඳහා වෙහෙසුණු එහෙත් පසුව හිට්ලර්ගේම වධ බන්ධනයට පත්වුණු ජර්මන් ජාතික පූජකවර මාර්ටින් නීමොලර් (Martin Niemoller - 1892-1984) ගේ පැදියකින් උපුටා ගැණින.